# (ඇ) මහ බැංකු කටයුතු

මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිත 1966 වර්ෂය තුළ දී රුපියල් දශ ලක්ෂ 139·2 පහළ යමින් වර්ෂාවසානයේ දී එය රුපියල් දශ ලක්ෂ 143·0 විය. අන්තර් ජාතික මූල්‍ය අරමුදලින් මහ බැංකුව මිල දී ගත් ශුද්ධ විදේශීය විනිමය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 71·4 කි. කෙසේ වෙතත් අපනයන වෙළෙඳාමේ පැවැති පරිහානිය ආර්ථික ක්‍රමයේ විදේශීය විනිමය ඉපැයුම් තියුණු ලෙස අඩු කළ අතර, මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිත ද වර්ෂය තුළ දී නොකඩවා ම පිරිහුණි.

මහ බැංකුවේ දේශීය වත්කම් 1966 වර්ෂයේ දී රුපියල් දශ ලක්ෂ 305·2 කින් ඉහළ ගියේ ය. මහ බැංකුව වෙතැති රජයේ හා රජය සහතික කළ සුරැකුම් පත් දැරීම් රුපියල් දශ ලක්ෂ 155·9 කින් ඉහළ යද්දී, විශේෂ ණය හා තාවකාලික අත්තිකාරම් සැපැයීම් පිළිවෙළින් රුපියල් දශ ලක්ෂ 21·2 ක් හා රුපියල් දශ ලක්ෂ 5·3 වශයෙන් වැඩි විය. එහෙයින්, මහ බැංකුවට ඇති රජයේ මුළු ණයගැතිකම රුපියල් දශ ලක්ෂ 182·4 කින් ඉහළ ගියේ ය. වෙළෙඳ බැංකු වල ණය ගැනීම් රුපියල් දශ ලක්ෂ 36·4 කින් ඉහළ ගිය අතර, ' අනෙකුත් වත්කම් හා ගිණුම් ' රුපියල් දශ ලක්ෂ 86·4 කින් වැඩි විය.

මහ බැංකුව වෙතැති රජයේ හා ජාත්‍යන්තර සංවිධාන වල තැන්පතු වැඩිවීම, වෙළෙඳ බැංකු තැන්පතු පහළ යාමෙන් තරමක් දුරට කැපී ගියත්, බැංකුවේ මුළු තැන්පතු වගකීම් 1966 වර්ෂයේ දී රුපියල් දශ ලක්ෂ 114·8 ඉහළ යාමට ප්‍රධාන වශයෙන් හේතු විය. වර්ෂය තුළදී මහ බැංකුවේ මුදල් නිකුතුව රුපියල් දශ ලක්ෂ 9·1 කින් පහළ වැටිණි.

**ණය ප්‍රතිපත්තිය**

වෙළෙඳ බැංකු ණය ප්‍රසාරණය, සීමා කිරීම් වස් මහ බැංකුව 1965 වර්ෂයේදී ගත් පියවරවල් පසුගිය වාර්ෂික වාර්තාවේ සඳහන් කරන ලදී. 1965 හේ වර්ෂය තෙක් ම පෞද්ගලික අංශයට වෙළෙඳ බැංකු ලබා දෙන ණය නොනවත්වා වේගයෙන් වැඩිවීමක් දක්නට ලැබුණ අතර, මහ බැංකුව විශේෂයෙන් උනන්දු වූයේ, වැඩිමනත් මූල්‍ය ඉල්ලුමක් හා සමපේක්ෂණ බඩු සැඟවීමක් මතු වීමට ඇති හැකියාව කෙරේය. 1965 දී මහ බැංකුව ගත් මූල්‍ය විධිවිධාන මූලික වශයෙන් ම, මහ බැංකු පොලිය වැඩි කිරීමෙන් හා වෙළෙඳ බැංකු වල ණය ප්‍රසාරණයට උපරිම සීමාවක් පැනවීමෙන් සැකැසිණි. නිෂ්පාදන අරමුණු සඳහා ණය මුදල් මෙහෙයවීමටත් පාරිභෝජන ණය අධෛර්‍යය කිරීමටත් වෙළෙඳ බැංකු පොළඹවා ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම ද මහ බැංකුවෙන් කෙරුණි. 1965 අග වන විට ණය ප්‍රාසාරණ වේගය සැලකිය යුතු තරමින් අඩුවීමක් දක්නට ලැබුණි. 1963 හා 1964 වර්ෂයේ දී පිළිවෙළින් සිදු වූ වැඩිවීම වන රුපියල් දශ ලක්ෂ 136·9 හා 62·8 සමග සංසන්දනය කරන කල, 1965 දී වෙළෙඳ බැංකු පෞද්ගලික අංශයට සැපැයූ මුළු ණය ප්‍රමාණය ඉහළ ගියේ රුපියල් දශ ලක්ෂ 4·2 කිනි.

1965 දී හඳුන්වා දුන් මූල්‍ය විධිවිධාන 1966 වර්ෂයේ දී ද ක්‍රියාත්මක විය. 1966 වර්ෂයේ පැවැති ආර්ථික තත්ත්වයන් යටතේ බැංකු ණය සඳහා ඉල්ලුම මුල් මාස වල දී දිගට ම ඉහළ මට්ටමක තිබුණ අතර, ණය මුදල් සැපැයුමේ ප්‍රාසාරණයක් ද දක්නට ලැබිණ. කෙසේ වෙතත්, එවිට ක්‍රියාත්මකව පැවැති උපරිම ණය සීමාව තෙක් මුළු ණය ප්‍රමාණය ඉහළ ගිය බවක් පෙනෙන්නට නොවීය. අනතුරු කාලයේ දී වෙළෙඳ බැංකු ණය ප්‍රාසාරණයක් සිදු වුනත්, එම ප්‍රාසාරණය වැඩිමනත්යයි කල්පනා නොකරන ලදී. එපමණක් නොව, වැඩි වූ බැංකු ණය ප්‍රමාණයෙන් විශාල කොටසක් නිෂ්පාදන අරමුණු සඳහා යොමු විය.

1965 මැයි 28 වැනි දින නියම කළ 5% මහ බැංකු පොළී අනුපාතය 1966 වර්ෂයේ දිගටම ක්‍රියාත්මක විය.

**බැංකු කටයුතු වල දියුණුව**

ග්‍රාමීය ණය සම්බන්ධයෙන්, සමූපකාර ව්‍යාපාරයේ ක්‍රියාකාරීත්වය පරීක්ෂා කිරීමට 1966 ජනවාරියේ දී රජය විසින් කාරක සභාවක් පත් කරන ලදී. මෙම කාරක සභාවේ යෝජනා අනුව (කාරක සභාවට මහ බැංකුවේ ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ ඇතුළත්ය.) දැනට ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මගින් සමූපකාර සමිතිවල සාමාජිකයනට දෙන වගා ණය, මින් ඉදිරියට මහ බැංකුවේ සම්බන්ධය ද ඇතිව මහජන බැංකුව හා මෙම වැඩ පිළිවෙළට එක්වීමට කැමැති අනෙක් බැංකු මගින් ක්‍රියාත්මක කළ යුතු යයි රජය තීරණය කළේය. මෙම තීරණය ක්‍රියාත්මක කිරීම් වස් මහ බැංකුව, වගාකරුවන්ට දෙන ණය නොගෙවා සිටියොත්, එකී ණයෙන් 75% දක්වා රජය වෙනුවෙන් සහතික කිරීමේ ක්‍රමයක්, සකස් කර ගෙන යමින් සිටී. 1967 මහ කන්නයේ සිට ගොවියන්ට ණය දීමට කල් ඇතිව, මෙම වගා ණය ක්‍රමයත්, ඒ හා සම්බන්ධ ණය සහතික කිරීමේ ක්‍රමයත්, ඇරඹෙනු ඇත. එසේ ම මහ බැංකුව විසින් මෙම වැඩ පිළිවෙළ යටතේ වෙළෙඳ බැංකු මගින් දෙන ණය ප්‍රතිමුදල් කිරීම ද කරනු ලැබේ. ලංකාවේ ග්‍රාමීය ණය ප්‍රශ්නයන් නිරන්තර පරීක්ෂණයන්ට භාජනය කරමින් ක්‍රියා කරන ග්‍රාමීය ණය පිළිබඳ අළුත් අංශයක් ද ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව තුළ පිහිටුවන ලදී.